**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ**

**පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය.**

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 244 රීතියේ විධිවිධාන අනුව සංවර්ධන නිලධාරී සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

## 2.අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන් පිළිබඳ විස්තර

### 2.1 අදාළ නිලධරයන්

2.1.1 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරී සේවයේ III, II, I ශ්‍රේණිවල නිලධරයන්, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධරයන් හා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ නිලධරයන් සඳහා මෙම අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ වේ.

2.1.2 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන එහෙත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ නොකළ නිලධරයන් සඳහා මෙම අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ නොවේ.

2.1.3 ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර එම ස්ථාන මාරු ලැබී ඇති නිලධරයන් හට මේ යටතේ ස්ථාන මාරු අයදුම් කළ නොහැක.

### 2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1 එකම සේවා ස්ථානයක අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

2.2.3 දිස්ත්‍රික්කය තුළ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්/දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

2.2.4 එකම සේවා ස්ථානයේ වසර 07ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටතට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කළ යුතුය.

### 2.3 ක්‍රමවේදය සහ අනෙක් කරුණු

I. අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියේ 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටෙක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

II. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වැඩිම සේවා කාලයක් හෝ 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

III. තමා ස්ථිරව පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්කයක වසර 05 කට වඩා සේවය කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය හිමි වේ.

IV. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල සමබරතාවය රැකීමට ද හැම විටම උත්සාහ කළ යුතුය.

**2.4 සේවා කාලය ගණනය කිරීම.**

I. අභ්‍යන්තර ස්ථාන මාරුවීම්වල දී කාල ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට ය.

II. සේවා කාලයක් ගණනය කිරීමේ දී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනය යි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි. (තවද, නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

III. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක සිට වෙනත් අමාත්‍යාංශයකට/ දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කිරීමට සිදු වූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේ දී අහෝසි කරන ලද අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවා කාලය ද, විනය හේතු හෝ දඬුවම් මාරුවක් ලෙස ස්ථාන මාරු ලද නිලධාරීන් හැර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවශ්‍යතාව මත ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ සේවා කාලය ගණනය කිරීමේ දී, ඔවුන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ සේවය කළ සේවා කාලය ද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

IV. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේ දී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළ ද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

## 03.අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

අංක 2310/29 හා 2022.12.14 දිනැති ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 250 සංශෝධනය අනුව ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත පරිදී වේ.

**3.1 අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටුව**

I. සභාපති - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන)

II. සාමාජික - සුදුසු මාණ්ඩලික නිලධාරියෙක්

III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක් (සංවර්ධන

කාර්යභාරය - අභ්‍යන්තර ස්ථාන මාරු සම්බන්ධ ප්‍රතිපත්තීන්ට යටත්ව දිස්ත්‍රික්ක අතර ස්ථාන මාරු සඳහා අවශ්‍ය නිර්නායක සකස් කර සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා බලා එම ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිර්දේශ ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

**3.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව**

I. සභාපති - සහකාර දිස්ත්‍රික් ලේකම්
II. සාමාජික - විෂය භාර මාණ්ඩලික නිලධාරියෙක්
III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක්

කාර්යභාරය - අභ්‍යන්තර ස්ථාන මාරු සම්බන්ධ ප්‍රතිපත්තීන්ට යටත්ව දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර ස්ථාන මාරු සඳහා අවශ්‍ය නිර්නායක සකස් කර සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා බලා එම ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිර්දේශ දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

**3.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව**

I. සභාපති - සහකාර ප්‍රාදේශීය ලේකම්
II. සාමාජික - විෂය භාර මාණ්ඩලික නිලධාරියෙක්,
III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක්

කාර්ය භාරය - අභ්‍යන්තර ස්ථාන මාරු සම්බන්ධ ප්‍රතිපත්තීන්ට යටත්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාන මාරු සඳහා අවශ්‍ය නිර්නායක සකස් කර සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා බලා එම ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිර්දේශ ප්‍රදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

**3.4 අමාත්‍යාංශයෙන් පිටතට සිදු කරනු ලබන ස්ථාන මාරු**

අමාත්‍යාංශයෙන් පිටතට සිදු කරනු ලබන ස්ථාන මාරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්ෂික ස්ථාන මාරු යටතේ සිදු කරනු ලබයි.

**<u>04. අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචනය කිරීම.</u>**

**4.1 අමාත්‍යාංශ ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

I. සභාපති - අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
II. සාමාජික - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන)
III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක්

කාර්ය භාරය - සංවර්ධන නිලධාරීන්ගේ දිස්ත්‍රික්ක අතර සිදුවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලා අභියාචනා තීරණ දැන්වීම.

**4.2 දිස්ත්‍රික් ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

I. සභාපති - අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන)

II. සාමාජික - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක්

III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක්

කාර්ය භාරය - සංවර්ධන නිලධාරීන්ගේ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර සිදුවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා නිර්දේශ සලකා බලා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

**4.3 ප්‍රාදේශීය ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

I. සභාපති - ප්‍රාදේශීය ලේකම්

II. සාමාජික - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙක්

III. සාමාජික - සංවර්ධන නිලධාරී සේවාවට අයත් නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදා හැර ඇති නිලධාරියෙක්

කාර්යභාරය - සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිදුවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලා අභියාචනා තීරණ දැන්වීම.

**<u>05. අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීමේ දී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු</u>**

**5.1 විශේෂ කරුණු**

I. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම, එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. (අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධව පසුව සලකා බලනු නොලැබේ.)

II. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය

III. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන් හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

IV. ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව ස්ථාන මාරුවීම් නොකළ යුතුය.

V. නිලධාරියාට මෙන්ම ඔහුගේ පවුලේ අයට ද ඇති විය හැකි අපහසුතාවයන් අවම කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවක් ලබා දීමට පහසු වීම පිණිස නිලධාරියෙකු දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීමක් ඉල්ලුම් කරන අවස්ථාවේ දී ඔහු විසින් ස්ථාන මාරුව ඉල්ලා සිටින දිස්ත්‍රික්කයට අමතරව තවත් විකල්ප දිස්ත්‍රික්ක දෙකක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

## 5.2 අභ්‍යන්තර ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්

I. අවුරුදු 53 ඉක්ම වූ නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුව ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

II. අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට අවුරුදු 58 ඉක්ම වූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකළ යුතුය.

## 06. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම හා වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | ජූලි මස 02 වන දිනට පෙර |
| 02 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | ජූලි මස 15 වන දිනට පෙර |
| 03 | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම හා වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | ජූලි මස 23 වන දිනට පෙර |
| 04 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. | අගෝස්තු මස 05වන දිනට පෙර |
| 05 | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | අගෝස්තු මස 18 වන දිනට පෙර |
| 06 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාල බලධාරි වෙත භාර දීම හා අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | සැප්තැම්බර් මස 01වන දිනට පෙර |
| 07 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | ජනවාරි මස 01 දින සිට |

**07.ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියාපටිපාටිය**

7.1. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 03A හා 03B ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2.රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා හා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 07 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළ දී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

7.4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු, ලිපිලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේ ය. එසේවුවද වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපි ගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ ඔක්තෝම්බර් මස 22 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

7.5.මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේ ය.

7.6. ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

[illegible] සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයන් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ [illegible] අභියාචක වෙත දන්වන ලෙස දන්වනු ලබන අතර, එම තීරණ අනුව පරිදි, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හා [illegible] වෙත [illegible] ය.

7.8. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරී පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

(signature)

(stamp: ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ලේකම් රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

නිල මුද්‍රාව:

දිනය: 25/03/2021